# සිංහල



## 2 ශ්‍රේණිය

# 6. සමානාර්ථ පද හඳුනා ගනිමු.

## ක්‍රියාකාරකම 1

### පියවර 1

- දරුවා සමඟ පරිසරයට යන්න. ගසක් පෙන්වා ගසට කියන තවත් නමක් ඇසීම. (මෙම වචන පළමු වන ශ්‍රේණියේ දී ඉගෙන ගෙන ඇත.)
- ඒ ආකාරයට ඉර, අහස, අම්මා, තාත්තාපෙන්වා සමාන වචන විමසීම.







| | | | | |
|---|---|---|---|---|
| ගස | ඉර | අම්මා | තාත්තා | අහස |
| රුක | හිරු | මව | පියා |ගුවන |

- මෙම සමානාර්ථ පද ශබ්ද නඟා කියවන ලෙස දරුවාට කීම.

### පියවර 2

| | | | | |
|---|---|---|---|---|
| ගෙදර, | පාසල, | ඔළුව, | පාර, | තරු |

- ඉහත වචන අර්ථවත් වන පරිදි දරුවා ලවා චිත්‍ර අන්දවන්න. එම වචන ද චිත්‍ර යටින් ලියවන්න.

උදා:



ගෙදර



තරු

### පියවර 3

- පහත වචන කඩදාසි පටිවල ලියාගන්න.

| | | | | |
|---|---|---|---|---|
| නිවස | විදුහල | තාරකා | මාර්ගය | හිස |

අන්තර්ගතය : උතුරුමැද පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

සැකසුම : ටී.ඒම්.ජී දුලාන් සංජීව, නු/ගාමිණී මධ්‍ය මහා විද්‍යාලය, නුවරඑළිය

- ගෙදර චිත්‍රය පෙන්වා ගෙදරට කියන සමානාර්ථ පදයක් අසන්න. එම පදය අදාල චිත්‍රයේ වචනය යටින් අලවන්න.





ගෙදර

නිවස

තරු

තාරකා

## පියවර 4

- එම සමානාර්ථ පද කිහිපවරක් කියවන්න.

# 7.ක්‍රියාකාරකම 2

## පියවර 1

- සමානාර්ථ පද සඳහා අඳින ලද චිත්‍ර පෙන්වා ඒ පිළිබඳ ව කතාබහ කිරීම.

## පියවර 2

- එම චිත්‍ර දෙස බලා වැකි ගොඩනහා පැවසීමට යොමු කරන්න.
  - අපේ ගෙදර ලස්සන යි.

    අපේ නිවස ලස්සන යි.

  - අහසේ තරු පායලා.
    අහසේ තාරකා පායලා.

**පියවර 3**

- සමාන පද යා කරන්න.

| | |
|---|---|
| ගස | මව |
| ඉර | ගුවන |
| අම්මා | රුක |
| තාත්තා | හිරු |
| අහස | පියා |

| | |
|---|---|
| ගෙදර | හිස |
| පාසල | මාර්ගය |
| ඔළුව | තාරකා |
| පාර | නිවස |
| තරු | විදුහල |